**අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - 2018**

**--------------------------------------------------------**

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැඩසටහනේ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ස්ත්‍රී පුරුෂ ද්විතීයික පාසල් උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩිදියුණු කිරීම සඳහා නවීකරණය කරන ලද ද්විතීයික පාසල් අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් වලට අනුව, රු.මිලියන 26,000 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර ඉන් රු.මිලියන 26,000 කට සමාන එජඩො 200 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2013 අගෝස්තු 23 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය කළමනාකරණ වාර්තාව පළාත් 09 හි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන මගින් සපයන තොරතුරු සමග එකඟ වන අතර පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති එම්ඕඑෆ්පී/ඊආර්ඩී/ 2007/02 දරන චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව 2019 මාර්තු 31 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වුවද, විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2019 ජූනි 13 දිනය. | මූලික අවශ්‍යතාවය ට අනුකූල නොවීම. | අදහස් දක්වා නොමැත | පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රථම ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ උපලේඛන 03 ට අනුව වියපැහැදම් සම්බන්ධ දර්ශක 33 ක් මඟින් වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල 09 අත්කර ගැනීමට ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ වැඩසටහනේ වාර්ෂික මූල්‍ය වාර්තාවට අනුව පළාත් සභාවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට සියලුම අරමුදල් ප්‍රභවයන්ගෙන් මුළු පිරිවැය රු. මිලියන 139,584 ක් වියදම් කර තිබුණි. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල කටයුතු සම්බන්ධයෙන් කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහතින් විස්තර කර ඇත.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විභාග දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාවට අනුව, අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි පාසල් අයදුම්කරුවන් 218,191 දෙනෙකුගෙන් සියයට 8.34 ක් නියෝජනය කරන පාසල් අයදුම්කරුවන් 18,203 දෙනෙකු සියළුම විෂය ධාරාවන්ගේ සියලුම විෂයයන් අසමත් වී තිබුණි. තවද, උතුරු, මැද, නැගෙනහිර සහ | දුරස්ථ ප්‍රදේශවල අපේක්ෂිත ඉලක්ක ළඟා වී නොමැත. | එකඟ වේ. | හේතු විමර්ශනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දකුණු පළාත්වල පාසල් සිසුන්ගෙන් සියයට 9 කට වඩා වැඩි පිරිසක් සියලුම විෂය ධාරාවන්ගේ සියලුම විෂයයන් අසමත් වී තිබුණි. | | | |
| (ආ) | වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල - 03 අනුව පාසල් 100 තාක්ෂණ විෂය ධාරාව හදාරන ශිෂ්‍යයින්ගේ කාර්යසාධනය පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට සහ තාක්ෂණ විෂය ධාරාව සඳහා ස්ත්‍රී පුරුෂයින් ඇතුළත් වීම පුළුල් කිරීම සඳහා කාල සීමා සැලැස්මක් පිළියෙල කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, ඒ සම්බන්ධ තක්සේරුවක් සිදු කිරීමට සහ කාල සීමා සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ ළඟා නොවේ. | ශ්‍රී ලංකාවේ අ.පො.ස. උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව සඳහා ගුණත්වය වැඩිදියුණු කිරීමේ සැලැස්ම (2018-2022) පිළියෙල කර තිබුණු අතර 2017 දෙසැම්බර් ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කර ඇත. | ඉලක්ක ළඟා කර ගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) | වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල - 06 අනුව අ.පො.ස. උසස් පෙළ වාණිජ විෂය ධාරාව සඳහා පළාත් පාසල්වල ශිෂ්‍යයින්ගේ ඇතුළත්වීම් සියයට 43.01 ක් දක්වා වැඩිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, වාණිජ විෂය ධාරාව සඳහා සමස්ත ශිෂ්‍යයින්ගේ ඇතුළත් වීම සියයට 22.23 ක මට්ටමක පැවතුණි. තවද, වයඹ නැගෙනහිර සහ උතුරු පළාත්වල වාණිජ විෂය ධාරාව සඳහා ශිෂ්‍යයින්ගේ ඇතුළත් වීම පිළිවෙලින් සියයට 13.09, සියයට 16.31 සහ සියයට 17.86 ලෙස පැවතුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී කලා විෂය ධාරාව සඳහා සමස්ත ශිෂ්‍යයින්ගේ ඇතුළත් වීම සියයට 1.46 කින් වැඩි වී තිබුණි. | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ ළඟා නොවේ. | අ.පො.ස. උසස් පෙළ වාණිජ විෂය ධාරාවේ ශිෂ්‍යයින්ගේ ඇතුළත් වීමේ දත්ත විශ්ලේෂණය කිරීමෙන් පසු වියපැහැදම් සම්බන්ධ ප්‍රතිඵල - 06 සියලුම පාර්ශවයන්ගේ එකඟතාවය මත අවලංගු කරන ලදී. | හේතු විමර්ශනය කළ යුතුය. |

## 3.2 භාවිතා නොකළ සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල ප්‍රාග්ධන වියදම් දැරීමට පළාත් සභා සඳහා සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු. මිලියන 16,007 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ඉන් 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 10,717 ක් උපයෝජනය කර තිබුණි. තවද, උතුරු මැද පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද රු. මිලියන 5,159 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 2,237 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, ඌව පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා රු. මිලියන 700 මුදලක් ප්‍රතිපාදනය කරන ලද අතර ඉන් 2018 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රතිපාදනයෙන් සියයට 37 නියෝජනය කරන එකතුව රු. මිලියන 443 ක් උපයෝජනය නොකර පැවතුණි. | ව්‍යාපෘතිය යටතේ කරන ලද ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොමැත. | එකඟ වේ. | අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ප්‍රතිපාදන උපයෝජනය පළාත් අධිකාරීන්ට ලබා දීම අවශ්‍ය වේ. |